# SLLA පුවත් හසුන


වෙළුම 37 | කලාපය 02 | ඔක්තෝබර් - දෙසැම්බර් 2020 | ISSN 1391 -2531


## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පළමු සභා රැස්වීම 2020/2021





ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පළමු සභා රැස්වීම (2020/2021) 2020 ඔක්තෝබර් මස 3 වන දින අනුරාධපුර මහගෙදර හෝටලයේ දී පැවැත්විණි. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති ආචාර්ය රුවන් ගමගේ මහතා, හිටපු සභාපති ආචාර්ය නයනා විජේසුන්දර මහත්මිය, ප්‍රධාන ලේකම් ආචාර්ය කේ.ආර්.එන්. හර්ෂනි මහත්මිය සහ අයනකුත් පාලක මණ්ඩල සාමාජිකයින් සහභාගි වූහ. තවද භික්ෂු විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය බෝධගම සුමන හිමි, අනුරාධපුර මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති ආර්. සමත්පාල මහත්මිය, පොළොන්නරුව පුරාණ තාක්‍ෂණ කෞතුකාගාරයේ පුස්තකාලයාධිපති ටී.එම්.ඒ.පී. තෙන්නකෝන් මහත්මිය, උතුරු මැද පළාතේ පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති අශෝක රාජපක්ෂ මහතා, උතුරු මැද පළාතේ පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ වාසනා දිල්රුක්ෂි මහත්මිය සහ ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ පුස්තකාලයාධිපති ඒ.එස්. සිරිවර්ධන මහත්මිය මෙම රැස්වීම් සමාරම්භක සැසිවාරයට සහභාගි විය.





## පහන් පූජා සහ ආශිර්වාද උත්සවය

2020 ඔක්තෝම්බර් මස 3 වන දින පැවති පළමු සභා රැස්වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 60 වන සංවත්සරය සැමරීම සඳහා ශ්‍රී මහා බෝධිය සහ රුවන්වැලිසෑය හිඳී විශේෂ පහන් පූජා සහ ආශිර්වාද උත්සවයක් සංවිධානය කරන ලදී. මේ සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයින් හා නිලධාරීන් සහභාගි විය.









## ඇතුල් පිටු


| | |
|---|---|
| SLLA පළමු සභා රැසවීම | 01 |
| පහන් පූජා සහ ආශිර්වාද උත්සවය | 01 |
| ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ හිටපු සභාපතිනියක වන ශ්‍රීකාන්ත ලක්ෂ්මී අරුලානන්දම් සිවනේශන් මහත්මියගේ පළමු වර්ෂ පූර්ණ ගුණානුස්මරණය | 02 |
| කොළඹ මහජන පුස්තකාලය - මාර්ගගත වැඩසටහන් | 02 |
| ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නීති රීති සංශෝධනය කිරීම | 02 |
| ගවේශනය: පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ නාමකරණයේ විකාශය | 03 |
| පුස්තකාල පර්යේෂණ විද්වත් සම්මන්ත්‍රණය 2020 | 04 |
| SLLA ප්‍රකාශන කමිටුව 2020/2021 | 04 |
| SLLA පාලක මණ්ඩල සාමාජිකයින් (COUNCIL MEMBERS) 2020/2021 | 04 |
| පුවත් හසුන (SLLA Newsletter Vol. 37. No. 3) | 04 |
| නිවේදන ශ්‍රී ලංකා පුස්තකාල විමර්ශන සඟරාව (SLLR) - වෙළුම 35, කලාපය 2 | 04 |





*Sri Lanka Library Association, Organization of Professional Associations, Sri Lanka, 275/75, Stanly Wijesundara Mawatha, Colombo 07, Sri Lanka, Tel/Fax: +94-11-2589103, Email:slla@sltnet.lk*

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ හිටපු සභාපතිනියක වන ශ්‍රීකාන්තලක්ෂ්මි අරුලානන්දම් සිවනේශන් මහත්මියගේ පළමු වර්ෂ පූර්ණ ගුණානුස්මරණය





යාපනය විශ්ව විද්‍යාලයේ පුස්තකාලයාධිපති ලෙස සේවය කරමින් සිටියදී 2019 වර්ෂයේ දෙසැම්බර් 25වන දින අභාවප්‍රාප්ත වූ ශ්‍රීකාන්තලක්ෂ්මි අරුලනාන්තම් සිවනේශන් මහත්මියගේ වර්ෂ පූර්ණ ගුණානුස්මරණ උපහාර උත්සවය 2020 දෙසැම්බර් 25 වන දින සවස 3.00 ට යාපනය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය විසින්, මාර්ගගත ක්‍රමය ඔස්සේ සංවිධානය කරන ලදී. මෙහි අනුස්මරණ දේශනය ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ආචාර්ය විශාකා රූබන් මහත්මිය විසින් පවත්වන ලදී. ඇය තම වෘත්තිය වෙනුවෙන් කැප වූ ක්‍රියාශීලි මෙන්ම ඉතාමත්ම ධෛර්ය සම්පන්න චරිතයකි. ඇයගේ ලේඛන තුලින් ගම්‍ය වන සුවිශේෂීත්වය වනුයේ ඇයටම අනන්‍ය වූ දැක්මකින් යුතුව සේවය කළ බවයි. බහුවිදමානයන් ඔස්සේ ක්‍රියාකාරී චරිතයක් වූ ඇය තොරතුරු විද්‍යා ක්ෂේත්‍රය වෙනුවෙන් ස්වකීය අභිප්‍රායන් පසෙකලා කැප වූ ආදර්ශමත් පුස්තකාලයාධිපතිවරියකි.

## කොළඹ මහජන පුස්තකාලය - මාර්ගගත

COVID-19 වසංගතය හේතුවෙන් පුස්තකාලය වසා දැමූ කාලය තුළ, කොළඹ මහජන පුස්තකාලය විවිධ ආකාරයේ වැඩසටහන් අන්තර්ජාලය හරහා පවත්වා ඇත. මෙම වැඩසටහන් Zoom සහ වෙනත් මාධ්‍ය හරහා පවත්වන ලදී. මෙයට අමතරව, ප්‍රකාශන හිමිකම් ගැටළු නොමැති පොත්, විවේකීව කියවීම සඳහා ෆේස්බුක් සහ බ්ලොග් හරහා PDF ආකාරයට පාඨකයින් වෙත සංසරණය කරන ලද අතර තෝරාගත් සඟරා ලිපි ද විදුලි පණිවුඩ යෙදුම (telegram app) හරහා සංසරණය කරන ලදී. Let's Read මාර්ගගත ක්‍රමය ඔස්සේ කතන්දර කීමේ සැසියක් පවත්වන ලද අතර මේ සඳහා ආසියානු පදනම (Asia Foundation) විසින් අනුග්‍රහය දක්වන ලදී.






Library Makerspace programme

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නීති රීති සංශෝධනය කිරීම

අවසාන සංශෝධනය සිදු කළ 2014 වර්ෂයේ  සිට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නීති රීති සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය දීර්ඝ කාලයක් තිස්සේ පැවති අතර මෙම අවශ්‍යතාවය LLA හි COMAISP විසින් නව ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත. එබැවින්, 2004 අංක 7 දරණ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (සංස්ථාගත කිරීම්) (සංශෝධනය) පනත හා 1974 අංක 20 දරණ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (සංස්ථාගත කිරීම්) පනත සමඟ අනුකූලව නීති රීති සංශෝධනය කිරීම සඳහා කිමිටුවක් පත් කරන ලදී. සංශෝධනය කිරීම හෝ හඳුන්වා දීම සඳහා කිමිටුවේ යෝජනා හා නිර්දේශයන් පහත පරිදි වේ.

- පාලක මණ්ඩලය (Council) සහ එක්ස්කෝ (ExCo) හි වගකීම් පිළිබඳ පැහැදිලි විස්තරයක් ඇතුළත් කිරීමට නියමිතය.
- නීතිරීති අතුරු ව්‍යවස්ථා ලෙස නම් කිරීමට යෝජනා කෙරේ.
- වාරික මහා සභා රැස්වීමේදී සම්මත කර ගත්ම අදාළ යෝජනා සහ පසුගිය පාලක මණ්ඩල රැස්වීම් වලදී  ගනු ලැබූ අදාළ තීරණ (ඇත්නම්) රීතිවලට ඇතුළත් කිරීම අවශ්‍යවේ.
- සිසුන්, ආයතන වැනි නව සාමාජික කාණ්ඩ හඳුන්වා දිය යුතුය.
- ආයතනික නොවන සාමාජිකත්වය සඳහා ලිඛිත ප්‍රතිපත්තියක් තිබිය යුතුය.
- කණ්ඩායම් කැඳවුම්කරුවන් සහ සාමාජිකයන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම තවත්ම යෝජනාවකි.
- උපායමාර්ගික සැලැස්ම යාවත්කාලීන කිරීමට අපේක්ෂා කෙරේ.
- සභාපති සහ තේරී පත් වූ සභාපති පැහැදිලි කාල රාමු සමඟ උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම් සකස් කළ යුතුය.

## පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ නාමකරණයේ විකාශය

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් පිරිනමනු ලබන ඩිප්ලෝමා පාඨමාලාවට දීර්ඝ ඉතිහාසයක් ඇති අතර 2020 වසර වන විට, එය එහි 60 වන සංවත්සරය සමරයි. මෙම කෙටි සටහන මගින් බලාපොරොත්තුවන්නේ දැනට අප සංගමය විසින් පිරිනමනු ලබන ඩිප්ලෝමා පාඨමාලාවන්ගේ වර්තමාන තත්ත්වය පිළිබඳ විස්තර කිරීමකි. මෙම පාඨමාලාව 1961 දී පමණ ආරම්භ කළ ද පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ ඇති අවශ්‍යතාවත් සහ අප රටේ පවත්නා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමඟ බද්ධව කටයුතු කළ යුතු වීමත් හේතුවෙන් මම ඩිප්ලෝමා පාඨමාලාව හැඳින් වූ නම කිහිප අවස්ථාවක දී වෙනස්වීම් වලට භාජනය විය. වගුව 1 අනුව, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් මෙහෙයවන මෙම පාඨමාලාවේ නම් වෙනස් කිරීම වසර කිහිපයක සිට සිදුව ඇතත් අවසන් වරට එය බලාත්මක වූයේ වර්ෂ 2020 දීය. එයට අනුව වර්තමානයේ දී මෙම පාඨමාලාව අදියර දෙකකින් පවත්වනු ලබයි. එනම් පෙර පැවති පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DIPLIS), පුස්තකාල හා තොරතුරු විද්‍යා ඩිප්ලෝමාව (DLIS) සහ පුස්තකාල හා තොරතුරු විද්‍යා උසස් ඩිප්ලෝමාව (HDIPLIS) නමින් පාඨමාලා දෙකක් වශයෙන් 2020 පෙබරවාරි මස 15 දින සිට පිරිනැමීමට කටයුතු කර ඇත. එම පාඨමාලා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) 2015 සංස්කරණයට අනුකූල වේ. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission - TVEC) මගින් ලබාදෙනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා රාමුවේ (National Vocational Qualification - NVQ) අදාළ නිළ ස්ථරය අප පාඨමාලාව සඳහා ලබාදී නැතත් SLQF හි විස්තර කර ඇති පරිදි සමාන්තර ස්ථර මට්ටමට අප මෙම පාඨමාලාව සඳහා භාවිත කර ඇත. ඒ සමගම ජාතික ප්‍රමිතීන්ට සමගාමීව පුස්තකාල හා තොරතුරු විද්‍යා සුදුසුකම් (LIS) ප්‍රමිතිකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයත්, පුස්තකාල හා තොරතුරු විද්‍යා පාඨමාලා ලබාදෙන අනෙකුත් අධ්‍යාපන ආයතනත් ඒකාබද්ධව TVEC ආයතනය සමග සමීපව කටයු කරන බව මෙහිලා සඳහන් කිරීමට කැමතිය. ඉහත සඳහන් දෙවන වගුවේ පළමු තීරු දෙක මගින් මෙම පාඨමාලාවේ නම් වෙනස් වී ඇති ආකාරය පිළිබඳව පැහැදිලිව දක්වා ඇත. ඩිප්ලෝමා/උසස් ඩිප්ලෝමා පාඨමාලාව (සම්පූර්ණ අදියර 3)

වගුව 1: ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවෙහි නාමකරණයේ විකාශය

| Year | Naming of three tiers |
|---|---|
| 1961 | a) First Examination of the Ceylon Library Association (sometimes named as the Librarianship - First Examination)<br>b) Intermediate Examination of the Ceylon Library Association<br>c) Final Examination of the Ceylon Library Association |
| 1998 | Change of names with the syllabus revision…<br>a) Diploma in Library and Information Science - Level I<br>b) Diploma in Library and Information Science - Level II-I<br>c) Diploma in Library and Information Science - Level II-II |
| 2008 | Renamed Levels II-I and II-II as Levels II and III.<br>a) Diploma in Library and Information Science - Level I<br>b) Diploma in Library and Information Science - Level II<br>c) Diploma in Library and Information Science - Level III |
| 2020 | Renamed the three tiers as two courses.<br>a) Diploma in Library and Information Science (DLIS)<br>b) Higher Diploma in Library and Information Science (HDIPLIS) - (I)<br>c) Higher Diploma in Library and Information Science (HDIPLIS) - (II) |

වගුව 2: ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සින් පිරිනමනු ලබන ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා පාඨමාලා පාඨමාලා පිළිබඳ තොරතුරු

| Previous Name of the course | Present Name & Acronym use | Qualification Earned | SLQF Level | Parallel NVQ Level* | Deliverables & Credits offered |
|---|---|---|---|---|---|
| Level I (DIPLIS) | Diploma **(DLIS)** | Diploma in Library and Information Science | SLQF 03 | NVQ 05 | 30 Credits<br>**Exit Level (Transcript + Diploma Certificate)** |
| Level II | Higher Diploma in LIS – Part I **HDIPLIS (I)** | - | - | - | **(Only the Transcript)** |
| Level III | Higher Diploma in LIS – Part II**HDIPLIS (II)** | Higher Diploma in Library and Information Science | SLQF 04 | NVQ 06 | 30 Credits**<br>**Exit Level (Transcript + Higher Diploma Certificate)** |

*** based on SLQF (2015)**

**** Levels II and III together contribute to the Higher Diploma**

එකවර හදාරන්නේ නම් ඒ සඳහා ගත වන කාලය අවුරුදු 03 කි. ශිෂ්‍යයෙක් උපරිම අවුරුදු 3 කට යටත්ව DLIS පාඨමාලාව සමූර්ණ කළ යුතුය. උසස් ඩිප්ලෝමාව උපරිම වශයෙන් අවුරුදු 05 ක් ඇතුළත සමූර්ණ කළ යුතුය. DLIS හා HDIPLIS සමූර්ණ කිරීම සඳහා දිය හැකි උපරිම කාල සීමාව අවුරුදු 8 කට යටත්වේ. මෙම වගුවේ අවසාන තීරුව මගින් පාඨමාලාව හදාරා බැහැර විය හැකි අවස්ථා දෙකක් පිළිබඳව දක්වා ඇත. එනම් DLIS හා HDIPLS මෙම පාඨමාලා දෙක සාර්ථකව සමූර්ණ කළ සිසුන්ට ප්‍රතිඵල ලේඛනය සහ සහතික පතක් හිමිවේ. එහිදී HDIPLIS(I) හා HDIPLIS(II) එකතුවීමෙන් උසස් ඩිප්ලෝමාවට දායක වේ. එබැවින් HDIPLIS(I) යනු පාඨමාලාවෙන් බැහැර වීමේ අදියරක් නොවන අතර එම අදියර සඳහා ලියාපදිංචි වන සෑම ශිෂ්‍යයෙකුටම හිමිවන්නේ අදියරට අදාල ප්‍රතිඵල ලේඛනය පමණි. මෙම වැඩි දියුණු කිරීම් හා වෙනස් කිරීම් හේතුවෙන් අනෙකුත් ආයතන විසින් පිරිනමනු ලබන වෙනත් පාඨමාලා සමග මෙම පාඨමාලාවේ ස්ථර හා තත්ත්වය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලැබෙනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු. එසේම මෙම පාඨමාලාව හැදෑරීමෙන් අනතුරුව ශිෂ්‍යයන් හට අනෙකුත් සුදුසුකම් ලබා ගත හැකි මාවත එනම් උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යයනයන් පිළිබඳවත් ඔවුන් හට පැහැදිලි අවබෝධයක් ලැබෙනු ඇත.

මෙම සටහන අවසන් කිරීම සඳහා උසස් ඩිප්ලෝමාව සම්පූර්ණ කරන සිසුන් හට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන පුස්තකාල හා තොරතුරු විද්‍යා ගෞරව උපාධි පාඨමාලාවට සම්බන්ධ විය හැකි අතර එහි පළමු වසර දෙක අධ්‍යයනයෙන් නිදහස් වීමට අවකාශය ලැබේ. එතුලින් ඔවුන්හට වසර දෙකකින් පුස්තකාල හා තොරතුරු විද්‍යා පිළිබඳ ගෞරව උපාධියක් ලබා ගත හැකිය. මෙයට අමතරව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ඩිප්ලෝමාව සහ එහි අවුරුදු 2 ක ආශ්‍රේය සාමාජිකත්වය (Associateship) දරණ අය හට කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනය (NILIS) විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා සම්බන්ධ විය හැකි ය.



**ආචාර්ය සී. එන්.කේ. අලහකෝන් මිය**
අධ්‍යාපන නිලධාරී (SLLA)
ජ්‍යේෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## පුස්තකාල පර්දේෂණ විද්වත් සේමන්රණය 2020 (Library Research Symposium)





කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල ජාලය අඛණ්ඩව තුන් වන වරටත් දැනුම් යුගයේ පුස්තකාල සේවා පිළිබඳ නැවත ආවර්ජනය යන තේමාව යටතේ 2020 දෙසැම්බර් 23 දින පුස්තකාල පර්ශේෂණ විද්වත් සම්මන්ත්‍රණය මාර්ගගතව පවත්වන ලදී. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිනි ජේෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජේරත්න මැතිණිය සහභාගි වූ අතර කොළඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ පීඨාධිපති ජේෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා මහතා ආරාධිත අමුත්තා ලෙස සහභාගි විය. ඉන්දියාවේ නවදිල්ලි ඉන්දිරා ගාන්ධි ජාතික කලා මධ්‍යස්ථානයේ පීඨාධිපති (IGNCA), අධ්‍යක්ෂ (පුස්තකාල හා තොරතුරු) හා IGNCA හි කලා නිධි අංශයේ අංශ ප්‍රධාන වන මහාචාර්ය රමේෂ් සී ගෞර් මහතා විසින් පුස්තකාලය ඉගෙනුම් අවකාශයක් ලෙස යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය පවත්වන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති ආචාර්ය ප්‍රදීපා විජේතුංග මහත්මිය මෙම විද්වත් සම්මන්ත්‍රණයේ මුලසුන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති ආචාර්ය එන්.ඩී. විජේසුන්දර මිය, කැළණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති ආචාර්ය සී.සී. ජයසුන්දර මහතා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති ආර්. මහේෂ්වරන් මහතා සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති ඩබ්.ජේ. ජෙයරාජ් මහතා මෙම සම්මන්ත්‍රණයෙහි තාක්ෂණික සැසි වල මුලසුන දැරීය. මෙම විද්වත් සම්මන්ත්‍රණය සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ අතර විශ්වවිද්‍යාල, රාජය හා පෞද්ගලික අංශ නියෝජනය කරමින් 80 කට අධික පිරිසක් සහභාගි වූහ.

## SLLA ප්‍රකාශන කමිටුව (Publication Committee)

### ප්‍රධාන කමිටුව

| | |
|---|---|
| ටී. ශ්‍රීධරන් මිය (ප්‍රකාෂණ නිළධාරී) | චන්ද්‍රිමා වාදසංහ මිය |
| කෝමදී මුරුගදාස් මිය | බී.එන්.ජී.ඒ. සුනිල් වේමරත්න මහතා |
| එම්.එස්.එම්. ෂිහාම් මහතා | ඒ.වී.එම්.වේ. අංකුඹුර මිය |
| පවිත්‍රා විජයවර්ධන මිය | |

### අනු කමිටුව (පුවත් හසුන)

| | |
|---|---|
| ටී. ශ්‍රීධරන් මිය | ගයනි ලසන්තා පෙරේරා මිය |
| කෝමදී මුරුගදාස් මිය | |

### අනු කමිටුව (සඟරා)

| | |
|---|---|
| ටී. ශ්‍රීධරන් මිය | බී.එන්.ජී.ඒ සුනිල් ප්‍රේමරත්න මහතා |
| චන්ද්‍රිමා වාදසිංහ මිය | එස්. නවනීතක්‍රිෂ්ණන් මයා |

## පුවත් හසුන (SLLA Newsletter Vol. 37. No. 3 (වෙ.37, ක.3, ජනවාරි - මාර්තු, 2021)

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන, ත්‍රෛමාසික පුවත් හසුනෙහි පළ කිරීම සඳහා, ඔබගේ පුස්තකාල තොරතුරුවල පුවත්, මෘදු පිටපතක් ලෙස (MS Word ආකෘතියෙන්) ප්‍රකාශන නිළධාරි sritharan@lib.cmb.ac.lk හෝ sllapublicationofficer@gmail.com වෙත, විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න .

## නිවේදන (Announcement)

ශ්‍රී ලංකා පුස්තකාල විමර්ශන සඟරාවී(ඛඛසෘ)වවළුම 35, කලාපය 2 වසරකට කලාප දෙකක් ප්‍රකාශයට පත්කරනු ලබන ශ්‍රී ලංකා පුස්තකාල විමර්ශන සඟරාවේ (Sri Lanka Library Review) 2021 වර්ෂයේ දෙවන කලාපය (වෙළුම 35, කලාපය 2) සඳහා 2021 මාර්තු මස 15 දින වන තෙක් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයින්ගෙන් සහ විද්වතුන්ගෙන් ලිපි (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) කැඳවනු ලැදේ. ඔබගේ ලිපියේ මෘදු පිටපතක් (MS Word ආකෘතියෙන්) ප්‍රකාශන නිලධාරි sritharan@lib.cmb.ac.lk හෝ sllapublicationofficer@gmail.com වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය හැකි අතර දේ පිළිබඳ වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ www.slla.org.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

## SLLA පාලක මණ්ඩල සාමාජිකයින් (COUNCIL MEMBERS) 2020/2021

සභාපති : ආචාර්ය රුවන් ගමගේ මහතා
හිටපු සභාපති : ආචාර්ය එන්. ඩී. විජයසුන්දර මිය
තේරී පත් වූ සභාපති : ආචාර්ය ආර්.ඩී. ආනන්ද තිස්ස මහතා
උප සභාපති : ඇන්ටන් නල්ලතම්බි මහතා
ප්‍රධාන ලේකම් : ආචාර්ය කේ.ආර්.ඒ.එන්. හර්ශනි මිය
සහකාර ලේකම් : ප්‍රියදර්ශනී හේමකුමාර මිය
භාණ්ඩාගාරික : වරුණී ගඟබඩආරච්චි මිය
අධ්‍යාපන නිලධාරී : ආචාර්ය චාපා අලහකෝන් මිය
සහකාර අධ්‍යාපන නිලධාරී : ප්‍රියානි බාලසූරිය මිය
ප්‍රකාශන නිලධාරී : ටී. ශ්‍රීධරන් මිය
තොරතුරු හා මහජන සම්බන්ධතා නිලධාරී : ආචාර්ය එස්.කේ. ඉලංගරත්න මහතා

### වෘත්තීය කණ්ඩායම් (Professional Group)

අධ්‍යයන පුස්තකාල : නෝමන් රවිකුමාර් මහතා
COMAISP : එස්. සාන්තරූබන් මහතා
රජයේ පුස්තකාල : යානිකා නන්දසේන මිය
ජාතික පුස්තකාලය : විජය ප්‍රේමදර්ශන මහතා
පළාත් පුස්තකාල : වසන්තා කුරුප්පු මිය
මහජන පුස්තකාල : ධම්මික වීරකෝන් මහතා
විශේෂ පුස්තකාල : රංජනී හේරත් මිය
පාසල් පුස්තකාල : චන්ද්‍රිමා දිසානායක මිය

### නම් කරන ලද පාලක මණ්ඩල සාමාජිකයින් :

1. ශිවන්ති වීරසිංහ මිය
2. ලාල් පන්නිල මහතා

### නම් කරන ලද හිටපු සම-සාමාජිකයින් :

1. සුනේත්‍රා පෙරේරා මිය
2. රුක්මලී සේපාලිකා මිය

ආපසු ලිපිනය : 

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය,
OPA මධ්‍යස්ථානය,
275/75, ස්ටැන්ලි විජේසුන්දර මාවත,

වෙත :